**කහවත්ත ප්‍රාදේශීය සභාව - 2023**
**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කහවත්ත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කහවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ ආරම්භ කර නොතිබුණු කර්මාන්ත 05ක රු.2,966,000ක කොන්ත්‍රාත් ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේදී ගිවිසුම් ගතව ඇති බැවින් ප්‍රාග්ධනිත කරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | දෙමහල් වෙළඳ සංකීර්ණයක ඉදිකිරීමේ පිරිවැය රු.9,730,708ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371 (5) අනුව, 2011 හා 2017 වර්ෂවල දී ලබා දුන් රු.93,175ක අත්තිකාරම් 02ක් පියවා නොතිබුණි. | හිටපු සභාපතිගෙන් හා හිටපු ලේකම්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතියි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,089,616ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,223,912ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,720,912 | 5,274,126 | 5,187,883 | 1,533,354 | 4,431,325 | 4,264,740 | 4,125,125 | 1,547,410 |
| කුලී | 10,388,400 | 11,352,635 | 11,378,240 | 772,419 | 9,093,792 | 8,477,967 | 7,860,617 | 1,156,849 |
| බලපත්‍ර ගාස්තු | 1,264,000 | 1,068,185 | 1,050,585 | - | 1,035,000 | 1,127,066 | 1,094,466 | - |
| වෙනත් ආදායම් | 3,509,000 | 2,183,410 | 2,445,052 | - | 2,617,000 | 1,891,537 | 1,464,743 | - |
| | 19,882,312 | 19,878,356 | 20,061,760 | 2,305,773 | 17,177,117 | 15,761,310 | 14,544,951 | 2,704,259 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,009,208ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා පැරණි රු.232,226ක ශේෂයක් විය. | අයකර ගත නොහැකි ශේෂ කපාහැරීමටත්, හිඟ ආදායම් අයකර ගැනීමටත් අපේක්ෂා කෙරේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | රු.77,295ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 05කට වඩා පැරණි රු.69,753ක ශේෂයක් විය. | හිඟ ශේෂය අය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | පොදු වෙළඳපොළ ඉහළ මහල තක්සේරුවක් නොමැතිව 2021 අගෝස්තු සිට රු.36,000ක මාසික කුලියකට බදු දී තිබුණු අතර ආරක්ෂිත ඇප තැන්පතුව රු.72,000ක් අඩුවෙන් ලබාගෙන තිබුණි. බදුකරු 2023 මැයි මාසයේ ගොඩනැගිල්ලෙන් ඉවත් වී තිබුණු අතර ඒ වනවිට පැවැති හිඟහිටි කුලී රු.518,000ක් මේ දක්වාම අයකර නොතිබුණි. | පෙර සිටි බදුකරු සඳහා නීතිමය කටයුතු සිදු කිරීම සඳහා නීතිඥවරිය වෙත මේ වන විට ලිපිගොනු භාර දී ඇති අතර මසක ගිවිසුම් ඇපයද හිඟ කුලියට හිලව් කිරීමට කටයුතු කරමි. | කඩ කුලිය තීරණය කිරීම, ගිවිසුම්ගතවීම මෙන්ම මාසිකව කුලිය අයකිරීම විධිමත් කළ යුතු වේ. |
| (ඇ) | සතිපොළ ඉහළ මහල තක්සේරුවක් නොමැතිව 2020 සැප්තැම්බර් සිට බදු දී තිබුණද, බදු කාල සීමාව ව්‍යාජ | මහ සභා රැස්වීමේ තීරණය අනුව ගොඩනැගිල්ල ලබා දී ඇත. පෙර සකස් කර ගත් | ගොඩනැගිලි කුලියට දීම විධිමත් ක්‍රමවේදයකට අනුව |

| | | | |
|---|---|---|---|
| | ලෙස අඩු කිරීම නිසා සභාවට රු.450,000ක ආදායමක් අහිමි වී තිබුණි. එහි මාසික කුලිය රු.50,000ක් ලෙස 2023 ජූලි මස තක්සේරු කර තිබුණද, මේ දක්වාම සංශෝධිත කුලිය අයකර නොතිබුණි. | ගිවිසුම පසු දිනක දී අත්සන් කිරීම නිසා මකන දියර භාවිතා කිරීමට සිදු විය. | සිදු කළ යුතු වේ. ව්‍යාජ ලෙස කුලී අඩු කිරීම පිළිබඳව විමර්ශනයක් කළ යුතු වේ. |
| (ඉ) | ආයතන 22කට අයත් දැන්වීම් පුවරු 58ක් සඳහා රු.316,487ක ගාස්තු අයකර නොතිබුණි. | ආයතන 04කට අදාළ දැන්වීම් පුවරු ගාස්තු මේ වන විට අය කරගෙන ඇත. | හිඟ ආදායම් අයකළ යුතු වේ. |
| (ඊ) | සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු හඳුනාගෙන ගාස්තු අයකර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා සමීක්ෂණයක් සිදු කර ගාස්තු අය කිරීමට කටයුතු කරමි. | ආදායම් නොපමාව අයකළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කහවත්ත, හවුපෙ වතුයාය තුළ කසළ බැහැර කරන අක්කර 04ක පමණ භූමි ප්‍රමාණය 2023 දෙසැම්බර් වනවිටත් සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | ඉඩම් කොටස මැන වෙන් කර ඇති අතර, පිඹුරුපත් අදාළ අමාත්‍යාංශය මඟින් වතු කළමනාකරණය වෙත ඉදිරිපත් කෙරේ. | ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | වාර්ෂිකව කසළ මෙට්‍රික් ටොන් 360ක් පමණ පරිසර හිතකාමීව බැහැරකර නොතිබුණි. | විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් මේ වන විට සකසමින් පවතියි. | විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 30 දිනැති 2313 අංක දරන ගැසට් නිවේදනය පරිදි සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අයකර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු මේ වසරේදී ආරම්භ කෙරේ. | සංවර්ධනය නොකළ ඉඩම්වලින් බදු අයකළ යුතු වේ. |
| (ආ) | බලපත්‍ර රහිතව පවත්වාගෙන යන මස් හා මාලු කඩ 04කට එරෙහිව නීතිමය පියවර ගෙන නොතිබුණි. | මෙම අනවසර ස්ථාන ඉවත් කිරීමට කටයුතු කර ඇත. | අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජල පාරිභෝගිකයින් 313කින් සමන්විත ඇන්දාන ජල ව්‍යාපෘතියේ ජලයෙහි ගුණාත්වය සම්බන්ධයෙන් පැමිණිලි 13ක් ලැබී තිබුණ ද, මේ දක්වාම ඒ පිළිබඳ තත්ත්ව පරික්ෂාවක් හෝ සිදුකර නොතිබුණි. | පිරිපහදු ඒකකයක් සකස් කිරීමට මූලික කටයුතු සකස් කර ඇත. | පානීය ජලයේ ගුණාත්වය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 නිෂ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු කටයුතු සඳහා සභාවට ලද අක්කර 01½ ක් විශාල ඉඩම වගා කර සංවර්ධනය කිරීමට 2022 ජූලි මස සභාව තීරණය කර තිබුණ ද 2023 දෙසැම්බර් වන විටත් එම ඉඩම නිෂ්කාර්යයව පැවැතිණි. | ඉඩමේ වූ රබර් ගස්වලින් ලැබෙන මාසික ආදායමෙන් රු.4000ක් සභාවට ගෙවීමට යෝජනා වුවද, විවිධ හේතු මත එය ක්‍රියාත්මක කළ නොහැකි විය. | ඉඩම ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.77,248,466ක් වූ ඉඩම් ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණවලට අදාළ වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. | සියලු විස්තර ඇතුළත් උප ලේඛනයක් මඟින් තොරතුරු යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාමට ඉදිරියේ දී කටයුතු කරමි. | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළයුතු වේ. |

**3.5 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු මස පරිත්‍යාගයක් ලෙස ලද වාහනයක අයිතිය පවරා ගෙන නොතිබුණි. එමෙන්ම 2022 වර්ෂයේ සිට එහි එංජිම අක්‍රීය වී තිබුණ ද, අලුත්වැඩියා කර නොතිබුණි. | ඉල්ලීම් කළද, මේ දක්වා අයිතිය පවරා දී නොමැති බැවින් විශාල වියදමක් කර අන්සතු වාහනයක් අලුත්වැඩියා කිරීම ගැටළුකාරී වී ඇත. | අයිතිය පවරාගෙන වාහනය ඵලදායී ලෙස උපයෝජනය කිරීමට හෝ පළාත් සභාව වෙත ආපසු භාරදීමට හෝ කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති ට්‍රැක්ටර් 02ක සහ ටේලර් 04ක අපහරණ කටයුතු 2023 දෙසැම්බර් වනතුරුත් නිමකර නොතිබුණි. | මෙම වාහන වෙන්දේසි කළ යුතු තත්ත්වයේ පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමි. | අංක 05/2020 හා 2020 ඔක්තෝබර් 02 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ගලි බැහැර කිරීම සඳහා අවශ්‍ය පහසුකම් නොමැති නිසා 2015 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලද ගලි බවුසරය ලද දින සිට නිෂ්කාර්යයව පැවැතිණි. | කසළ බැහැර කරන ඉඩම සභාව වෙත ලද පසු ගලි බැහැර කිරීම ආරම්භ කරන බව. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |